# බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කළා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශය

# පුරප්පාඩු තනතුරු

බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියෙහි පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) ( ASSITANT DIRECTOR - FINANCE ) (පුරප්පාඩු 01)

### සුදුසුකම් සහ පළපුරුද්ද

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය / ගණකාධිකරණය / මූල්‍ය කළමණාකරණය / වාණිජවේදී විෂයන්ගෙන් ලබාගත් උපාධිය.

**සහ**

උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර තුනක (03) ක පළපුරුද්ද

### වැටුප් පරිමාණය

MM 1-1 - 2016 - රු. 53,175/- - 10 x 1,375/- - 15 x 1,910/- - 95,575/-
මූලික වැටුප් තලය - 2020.01.01 රු. 53,175/- + ජි. වි. දීමනාව

**(අ) වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(ආ) බඳවා ගැනිමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ.

**(ඇ) පත් වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**(ඈ) සෑම ඉල්ලුම්කරුවෙකුම** : -

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.
IV. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.
V. ඉල්ලුම්පත් කැඳවන අවසන් දිනය වන විට බස්නාහිර පළාත තුල වසර 03 ක් අඛණ්ඩ පදිංචිය තහවුරු කල යුතුය.

### අයදුම්පත් එවිය යුතු ආකාරය : -

i) 2021.07.30 දිනට හෝ ඉන් පෙර ලැබෙන සේ සියලු අයදුම්පත් අදාල සහතිකපත් වල පිටපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම්පස අයදුම් කරන තනතුර සඳහන් කල යුතුය. අදාල අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii) දැනටමත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. තවද අපේක්ෂකයා තෝරාගනු ලැබුවහොත් මසක කාලයක් ඇතුළත ඔහු සේවයෙන් මුදා හැරිය හැකි බව එම ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

ඉහත සඳහන් ලේඛණ අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමේ සහ සුදුස්සන් තෝරාගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ අයිතිය තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය සතුවේ.

**සභාපති,**
**තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය,**
**ශ්‍රී සංඝරාජ මාවත,**
**කොළඹ 10.**

www.mytutor.lk
www.mytutor.lk

Source: Sent from suriyage.p@itrda.wp.gov.lk (2021.07.20)